නිපුණතා මට්ටම 5.5 - ආදායම් ප්‍රවේශය යටතේ දළ දේශීය නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීම

SNA 2008 නව ජාතික ගිණුම්කරණ ප්‍රවේශයට අනුව ශ්‍රී ලංකාවේ දළ දේශීය ආදායම් සංරචක පහත පරිදි වේ.

1.සේවක ආදායම්(CE)
2.දළ මෙහෙයුම් අතිරික්තය
-ශුද්ධ මෙහෙයුම් අතිරික්තය
-ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය .මෙම සංරචක දෙකෙහි එකතුවෙන් දළ මෙහෙයුම් අතිරික්තය නිර්මාණය වේ.
(දළ මෙහෙයුම් අතිරික්තය = ශුද්ධ මෙහෙයුම් අතිරික්තය + ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය)

3.මිශ්‍ර ආදායම්
4.නිෂ්පාදනය මත වෙනත් බදු

ඉහත දක්වා ඇති 1+2+3+4 සංරචක හතරෙහි එකතුවෙන් මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය ලැබේ.(මූලික මිලට දළ දේශීය නිෂ්පාදනය)

වෙළෙඳපල මිළ අනුව දළ දේශීය නිෂ්පාදනය =	මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය +	නිෂ්පාදනය හා ආනයන මත ශුද්ධ බදු

<u>අභ්‍යාසය</u>

	රු.මි.
1.සේවක ආදායම	3,000
2.ශුද්ධ මෙහෙයුම් අතිරික්තය	4,000
3.ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය	1,000
4.මිශ්‍ර ආදායම	2,000
5.නිෂ්පාදනය මත වෙනත් බදු	100
6.නිෂ්පාදනය හා ආනයන මත ශුද්ධ බදු	700

1.මූලික මිළ ගණන් අනුව සමස්ත එකතු කළ අගය (මූලික මිලට දළ දේශීය නිෂ්පාදනය) සොයන්න.
2.වෙළෙඳපල මිල අනුව දළ දේශීය නිෂ්පාදනය ගණනය කරන්න.